දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )NA/03/MS/01/2018
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.03. 05
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

---

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ,
ශික්ෂණ රෝහල්/මහ රෝහල්/අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් වෙත.

<u>I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) වාර්ෂික ස්ථාන මාරු - 2018</u>

ඔබ ආයතනයේ සේවය කරන මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ගන්නා ලද තීරණය අදාල නිලධාරීන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇත. ඒ අනුව “අවසන් නිර්දේශය ” ලෙස පවතින තීරුවේ ස්ථාන මාරු නියෝග ලබා දී තිබෙන නිලධාරීන්ගේ ස්ථාන මාරු 2019.03.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි මින් නියෝග කරමි.

02. I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධ පළ කරන ලද අංක 01-25 /2018 හා 2018.05.18 දිනැති චක්‍රලේඛයේ අනු අංක 2 යටතේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) තනතුරට උසස් වී තනතුරේ වැඩ භාරගත් දිනයට අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව ස්ථාන මාරු මණ්ඩලයක නිර්දේශ මත ස්ථාන මාරු නියෝග නිකුත් කර ඇති අතර එහිදී එකම දින I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) තනතුරට උසස් වී එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන් සිටියහොත් ඔවුන් පශ්චාද් ප්‍රාථමික හෙද විදුහල තුල හදාරන ලද වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවේ අවසන් විභාගයේ දී ලබා ගත් කුසලතාවය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ තැන තීරණය කර ඇත.

03. මෙහිදී සේවා කාලය පිලිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාල නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත්වලින් බැවින් එම අයදුම්පත්වල සඳහන් තොරතුරු ව්‍යාජ /අසත්‍ය බව පසුව හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බවට දන්වා සිටින අතර , එවැනි තොරතුරු මත ස්ථාන මාරු අයදුම්පත් සහතික කළ හා නිර්දේශ කළ නිලධාරීන් ද ඒ සඳහා වගකිව යුතු වේ.

04. සියළුම රෝහල්වල සේවා සැපයීම අඩාල නොවන සේ I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා ) නිලධාරීන් මුදා හැරීම සිදු කළ හැක.ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට ප්‍රමුඛතාවය දෙන ආකාරයෙන් නිදහස් කිරීම යෝග්‍ය වේ.

05. මේ සම්බන්ධව ඔබ ආයතනයේ අදාල සියලු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

ඒ.එම්.කේ.කේ. අත්තනායක
අතිරේක ලේකම්(පාලන)II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ඒ. එම්. කේ. කේ. ...
සෞඛ්‍ය, පෝෂණ ... අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.